# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2019

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා 2019 වසර වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ. ලියාපදිංචියට අදාල කාණ්ඩ පහත පරිදි වේ.

1 - යන්ත්‍ර සූත්‍ර
2 - පරිගණක , පරිගණක උපාංග සහ ජාලකරණය
3 - කාර්යාල උපකරණ
4 - කාර්යාලීය ලිපි ද්‍රව්‍ය, ටෝනර් වර්ග
5 - ගෘහ භාණ්ඩ
6 - මුද්‍රණ කටයුතු හා ප්‍රචාරක අයිතම
7 - ගොඩනැගිලි ද්‍රව්‍ය
8 - රෙදිපිළි සහ සම්භාණ්ඩ
9 - රථ වාහන අවශ්‍යතා
10 - සේවා සැපයීම්
11 - අලුත්වැඩියා
12 - උත්සව සහ සුබසාධන භාණ්ඩ
13 - ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්
14 - ආහාරපාන

*කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරිකයන් විය යුතුය.

**2.** කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හෝ කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 මඟින් **2018** ඔක්තෝම්බර් **01** දින සිට කාර්යාලීය වැඩ කරන දියන්හි දී පෙරවරු **9.00** සිට පස්වරු **2.00** තෙක් **2018** නොවැම්බර් **30** දින දක්වා, එක් කාණ්ඩයක් සඳහා ආපසු නොගෙවන රු. **300/-** ක මුදලක් ගෙවා අයදුම්පත් ලබා ගත හැකිය. එක් කාණ්ඩයක් යටතේ ඇති අනු කාණ්ඩ සඳහා අයදුම්කළ හැකි අතර, සෑම අනු කාණ්ඩයක්ම පැහැදිලිව දැක්විය යුතුය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලබන අතර,. අයදුම්පත් ප්‍රතික්ෂේප වුව හොත් ලියාපදිංචි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

**3.** සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2018** නොවැම්බර් **30** දින ප.ව.2.00 ට පෙර අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලිපිනයන්ට සෘජුවම ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අයදුම්පත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,කොළඹ **05** යන ලිපිනයට පමණක් ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් එදිනට පෙර භාර දිය යුතුය.

**4.** අයදුම්පත් ලබා ගැනීමට පෙර පරීක්ෂා කර බැලිය හැකි අතර වැඩි විස්තර සඳහා ගණකාධිකාරි දුරකථන අංක **011-2368152 , 011-2369143** අමතන්න.

දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

සුනිල් කන්නන්ගර
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
කොළඹ දිස්ත්‍රික්කය